පසුගිය දින සිදු වූ රෝහලක මුදල් මංකොල්ල කෑමට තැත් කිරීමක් යැයි පැවසෙන සිදුවීම බොහෝ මාධ්‍ය ඔස්සේ ආවරණය කොට තිබුණි. මෙහිදී අපට නිරීක්ෂණය කළ හැකි වූ එක් කරුණක් වූයේ සිදුවීමට අදාළ සැකකරුවාගේ අනන්‍යතාවය හඳුනාගත හැකි පරිද්දෙන් ඇතැම් මාධ්‍ය එම සිදුවීම ආවරණය කර තිබීමයි. උදාහරණයක් ලෙසින් දක්වන්නේ නම්, අද දෙරණ පුවත් විකාශයේ එම සැකකරුවාව දැක්වුණු අතර ඔහුගේ ඇස් බොඳ කර දැක්වීමට කටයුතු යොදා තිබිණි. එනමුත් එය ඔහුව හඳුනා ගැනීමට බාධාවක් නොවුණි.

මෙවන් අවස්ථාවක සැකකරුවාගේ අනන්‍යතාවය මහජන ලැදියාවට අදාළ වේ යැයි තර්ක ගෙන ආ හැක. කෙසේ නමුත් මීට අදාළව තිබෙන ජාත්‍යන්තර මාධ්‍ය ආචාර ධර්ම කතිකාවත් ඔස්සේ යෝජනා කෙරෙන්නේ, මාධ්‍ය මගින් මෙවන් අවස්ථාවක අදාළ සැකකරුගේ අනන්‍යතාවය හෙළිදරවු කරන්නේ නම්, එය මහජන ලැදියාවට අදාළ වන්නේ කෙසේද යන්නද ඒ ඔස්සේ සාධාරණීකරණය කළ යුතු බවයි. මෙම කරුණු සියල්ල එක්ව ගෙන බලන විට, මෙම සිදුවීමේ සැකකරුගේ අනන්‍යතාවය මාධ්‍ය ඔස්සේ හෙළිදරවු කළ යුතු යැයි ඔබ සිතන්නේද? ඒ සම්බන්ධයෙන් ඔබගේ අදහස කුමක්ද?

මේ සම්බන්ධයෙන් පළවී ඇති වැඩිදුර විස්තර සඳහා පිවිසෙන්න:
https://rm.coe.int/prems-guidelines-on-safeguarding-privacy-in-the-media-2018-/168090289b?fbclid=IwAR3IVhvtCQjdzY2cPHISEBOEyhyWRNvJ-i4Y1PdjBsdn6_Nw9U1MuJNziZ4
https://ethicaljournalismnetwork.org/the-public-interest
https://ijnet.org/en/story/applying-public-interest-test-journalism

#MediaEthics #lka #SinhalaNews #TVchannels #TVDerana